# ILO නායකයා වත්මන් වර්ධන න්‍යාය විවේචනය කරයි

ජාත්‍යන්තර කම්කරු සංවිධානය තම සියවැනි සංවත්සර සමුළුව 2011 ජුනි 01 දින ආරම්භ කළේ ය. ඒ වෙනුවෙන් නිකුත් කළ පණිවුඩය අවධාරණය කළේ සමාජ සාධාරණත්වය සහිත නව යුගයක් ආරම්භ කළ යුතුව ඇති බවයි. අද ලෝක තත්ත්වය තුළ ලෝක ව්‍යාප්ත විරැකියා ප්‍රශ්නයක් හා අර්ධ රැකියා ප්‍රශ්නයක් පැන නැගී ඇති බවත්, මෑත ඇතිවූ ගෝලීය මූල්‍ය අර්බුදය හේතුවෙන් මෙම ප්‍රශ්න උග්‍රවී ඇති බවත් එහි ප්‍රකාශ විය.

ජුනි 01 සිට 17 දක්වා පැවැත්වෙන මෙම ජාත්‍යන්තර කම්කරු සමුළුවේ දී ලෝකයේ දැනටත්, අනාගතයේදීත් උග්‍රවන ලෝක කම්කරු ප්‍රශ්න ගැනත් පෙර නොවූ විරූ තරම් විරැකියාව උග්‍රව ඇති තත්ත්වය හා ගෝලීය මට්ටමේ තරුණ විරැකියා අර්බුදය ගැනත් විවාද කෙරෙනු ඇත. සමාජ රැකවරණ දීමනා ලෝකයේ එබඳු කිසිදු රැකවරණයක් නැති ශ්‍රමිකයින් 10 දෙනෙකුගෙන් 8 දෙනෙක් දක්වා ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව ගැනද සාකච්ඡා කෙරේ. සේවා ස්ථානවල සාධාරණ සැලකිලි සහතික කෙරෙන පරිදි කම්කරු පරිපාලනයෙහි කාර්යය හැඩගැස්විය යුතු බව ද කියැවේ. කෝටි ගණන් වන, විශේෂයෙන් ගෘහස්ථ සේවිකාවන් ලෙස කටයුතු කරන ස්ත්‍රීන්ට වැඩකිරීමේ දී මූලික අයිතීන් සහතික වන පරිදි එම අයිතීන් ව්‍යාප්ත කළ යුතුය. ( ILO වෙබ් අඩවිය බලන්න) ILO සංවිධානයේ අධ්‍යක්ෂ ජෙනරාල් ජුවාන් සොමාවියා ( Juan Somavia ) සමාජ සාධාරණත්වය සහිත නව යුගයක අවශ්‍යතාවය ප්‍රකාශ කරමින් කියා සිටියේ ''ලෝකය සමාජ සාධාරණත්වය පිළිබඳ බරපතළ අභියෝගයකට මුහුණ දී සිටී.'' යනුවෙනි. මෙම 100 වැනි ILO සමුළුවේ දී සේව්‍ය හා සේවක නියෝජිතයින් තමන් සැබෑ ආර්ථිකයේ නියෝජිතයින් ලෙස මෙම අභියෝගයට මුහුණ දෙන්නේ කෙසේ ද? යන්න සලකා බලනු ඇත.

සොමාවියා ( Somavia ) විසින් ''සමාජ සාධාරණත්වය සහිත නව යුගයක්'' යන තේමාව යටතේ අලුත් වාර්තාවක් ඉදිරිපත් කරනු ඇත. මූල්‍ය අර්බුදයෙන් පසුව තත්ත්වය ගැන වැඩකරන අයගේ ''තත්ත්වය'' සලකා බැලෙනු ඇත.

එම වාර්තාවේ මෙසේ සඳහන් ය.

> *''වර්ධනය පිළිබඳ වත්මන් රටාවන් ආර්ථික වශයෙන් අකාර්යක්ෂම වී ඇත, සමාජයීය වශයෙන් අස්ථාවර වී ඇත, පාරිසරික වශයෙන් හානිකර වී ඇත, දේශපාලන වශයෙන් පවත්වා ගත නොහැකි වී ඇත, ඒ මගින් පැතිරුණු අතෘප්ති කර භාවයක් බිහිකොට ඇත. ඒ නිසා ඉල්ලා සිටිනුයේ ජනතාව විසින් ඉල්ලා සිටිනු ලබන පුළුල්වූත්, සමතුලිත වූත් ප්‍රතිඵල අත් කරදෙන නව ආකෘතියක ගෝලීයකරණයකි ''*

මෙම සමුළුව ප්‍රධාන පෙළේ රාජ්‍ය නායකයින් හා ජාත්‍යන්තර නියෝජිතයින් පිරිසක් විසින් අමතනු ඇත.

වැඩකරන ලෝකයේ වර්තමාන තත්ත්වයට අමතරව මෙම සමුළුවේ ප්‍රධාන තේමාවන් අතර, ගෘහස්ථ සේවය පිළිබඳව යෝජිත ජාත්‍යන්තර සේවා තත්ත්වයන් ගැන ද, උතුරු අප්‍රිකාව/මැදපෙරදිග හා අනෙකුත් කලාපවල තරුණ සේවා වියුක්තිය, ගෝලීයකරණය වන ආර්ථිකයක් තුළ සමාජ සාධාරණත්වය, වඩා සාධාරණ වූත්, හරිත වූත්, චිරස්ථායි වූත් ගෝලීයකරණයක් සහ සමාජ සාධාරණත්වය සහිත නව යුගයක් ආදිය වේ. අල්ලාගෙන ඇති අරාබි දේශයන් හි කම්කරුවන්ගේ තත්ත්වය ගැන මණ්ඩප සාකච්ඡාවක් ද වේ. ( ILO වෙබ් අඩවිය බලන්න) අනතුරු දායක කාර්යයන් හි නිරත වන ළමුන් පිළිබඳව ද මණ්ඩප සාකච්ඡාවක් පැවැත් වේ. මෙය ජුනි 12 දිනට යෙදෙන ළමුන්ගේ වැඩ ගැනීමට එරෙහි ලෝක දිනය නිමිත්තෙනි.

(2011 ජුනි 02 දින ''ද අයිලන්ඩ්'' පත්‍රයෙන් උපුටා ගන්නා ලදී.)

**සරත් ප්‍රනාන්දු**
**ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය**